සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## தென் மாகாணக் கல்வித் திணைக்களம்
## Department of Education, Southern Province

31054

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade : 7 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය / நேரம் / Time : පැය 2 යි

නම / பெயர் / Name ..............................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

### I - කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- I කොටසට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා, II කොටස සමඟ අමුණා භාර දෙන්න.

---

- 01, 02 ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත සාම්ප්‍රදායික යෙදුම්වලට වඩාත් ගැළපෙන පිළිතුරු තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

(01) පියදාස <u>මඬේ හිටවපු ඉන්න වගේ</u> යැයි මුදලාලි කීවේ ය.
(1) විශ්වාස කළ නොහැකි (2) නුගත් පුද්ගලයෙකු
(3) එක තීරණයක නො සිටීම (4) වියපත් තැනැත්තෙකු

(02) කමල්ගේ කතාවේ දී <u>බළලා මල්ලෙන් එළියට පැන්නේ ය.</u>
(1) වංචනිකයකු ලෙසට ප්‍රකට වීම. (2) සැඟවීමට උත්සාහ ගත් දෙයක් එළිදරව් වීම.
(3) මල්ලේ සිටි බළලා එළියට පැමිණීම. (4) නොසිතූ දෙයක් සිදුවීම

(03) සඳ මඬල වසා ගෙන කළු වලාකුළු ඇදිණ
මුළු ලොව ම ගනඳුරින් පටලවා ගනු ලැබිණ
ඉහත පද්‍ය පාදවල යෙදී ඇති සඤ්ඤක අකුරු යෙදුණු වචන ගණන වන්නේ,
(1) දෙකකි (2) තුනකි (3) හතරකි (4) පහකි

(04) මහාප්‍රාණ අක්ෂර දෙකක් හා අල්පප්‍රාණ අකුරක් පිළිවෙළින් යෙදුණු පද සහිත වරණය,
(1) සංඝ, ග්‍රන්ථ, කහ (2) ලේඛන, ලේකම්, වාර්තාව
(3) මහර, බෝධිය, පාලම (4) සංඝ, ලේඛන, සඵල

- 5 සිට 7 තෙක් ඇති ප්‍රශ්නවල අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(05) (1) විස්ථර (2) සම්මිශ්‍රණ (3) සමස්ථ (4) අවශේශ

(06) (1) දුෂ්කර (2) නිශ්පාදන (3) පිළිවෙල (4) වැඩපොල

(07) (1) මහළු (2) ළමයා (3) ඔටුණු (4) ළැහැබ

(08) "සමනලයෝ මල් පැණි බොති." යන වාක්‍යයේ 'සමනලයෝ' යනු;
(1) උත්තම පුරුෂ ඒක වචන උක්ත පදයකි.
(2) මධ්‍යම පුරුෂ බහු වචන උක්ත පදයකි.
(3) ප්‍රථම පුරුෂ ඒක වචන අනුක්ත පදයකි.
(4) ප්‍රථම පුරුෂ බහුවචන උක්ත පදයකි.

(09) යන්ත්‍රය, කුල්ල, වළ, කමත යන පදවල බහු වචන පද පිළිවෙළින් දැක්වෙනුයේ ,

(1) කුලු, යන්ත්‍ර, වළවල්, කමත්
(2) යන්ත්‍ර, කුලු, වළවල්, කමත්
(3) යන්ත්‍ර, කුල්ල, වළවල්, කමත්
(4) යන්ත්‍ර, කුලු, වළ, කමත්

(10) පහත කවියේ 3, 4 පද්‍ය පාද සම්පූර්ණ කරන්න.

බුදුන් වඩින වේලාවයි
කිරි උතුරන වේලාවයි
......................................................
......................................................

- තද කළු අකුරින් යෙදී ඇති පදයට සුදුසු විරුද්ධාර්ථ පද හිස්තැනට යොදා ලියන්න.

(11) කම්කරුවා **උඩ** වැඩ කරද්දි .......................... බැලීමට බිය විය.

(12) ................................. මිනිස්සු **අධම** ක්‍රියාවල නිරත නොවෙති.

(13) "මල්ලි උඩ පැන පැන මඩේ නටා ගෙදර ආවේ ය."යන වාක්‍යයේ ඉරි ඇති පදවල ක්‍රියා පද පිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,

(1) පූර්ව ක්‍රියා, පූර්ව ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(3) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා
(4) මිශ්‍ර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(14) නිවැරදි විරාම ලකුණු යොදන්න.
න්‍යෂ්ටික පවුල අම්මා තාත්තා දරුවෝ

- තනි පද ලියන්න.

(15) තමා උපන් භූමිය - ............................................
(16) ඉතා වේගයෙන් ධාවනය කරන - ............................................

- විශේෂණ පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(17) ........................... මාමා මෝටර් රථය ..................................... පැදවී ය.
(18) ............................ පැටව් සුළඟින් බිම වැටී .............................. නද දෙති.

- සමාන අර්ථ දෙන පද දෙක බැගින් ලියන්න.

(19) නාදය : ..................................... , ............................................
(20) මුහුද : ..................................... , ............................................

(ලකුණු 2x20 = 40)

## II - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

---

1. පෙළ පොතේ ඔබට නිර්දේශිත වේදිකා නාට්‍ය පිටපත පන්ති කාමරයේ දී රඟ දැක්වූයේ යැයි සිතා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   i. ඔබට නියමිත වේදිකා නාට්‍යයේ නම කුමක් ද?
   ii. එම නාට්‍යය රචනා කළේ කවුද?
   iii. නාට්‍යයේ ඔබ රඟපෑ චරිතයක් ලියන්න.
   iv. ඔබ රඟපෑ නාට්‍යයේ වඩාත් සිත් ගත් අවස්ථාවක් ලියන්න.
   v. මෙම පන්ති කාමර ක්‍රියාකාරකමෙන් ඔබ වර්ධනය කර ගත් ගුණාංග දෙකක් ලියන්න

(ලකුණු 2 x 5 = ලකුණු 10)

2. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.

   i. ජල සම්පත සුරකිමු
   ii. උඳුවප් පෝදා වැඩි සිරිපා
   iii. ලෝකෙන් උතුම් රට සිරි ලංකා
   iv. පොත් පත් අපේ මිතුරෝ ය
   v. පොදු දේපළ රැකගනිමු

(ලකුණු 20)

3. සෑම දිනක ම ඔබේ පාසල ආරම්භයේ දී හා අවසානයේ දී පාසල අසල විශාල වාහන තදබදයක් පවතී. මෙයට පිළියමක් ලෙස රිය නියාමන කමිටුවක් පත් කිරීමට විදුහල්පතිතුමා ද එකඟතාව පළ කර ඇත. දරුවන්ට මාර්ග නීති මෙන් ම රිය අනතුරු සම්බන්ධ දැනුම්වත් ව කටයුතු කිරීමට අවශ්‍ය වන පරිදි රිය නියාමන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා, ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිතුමා වෙත යැවෙන රාජකාරි ලිපිය සකස් කරන්න. ලිපිය ලියන ඔබ, පාසලේ දරුවකුගේ පියා වන චන්දන ලියනගේ මහතා යැයි සිතන්න.

(ලකුණු 10)

4. පෙළ පොත ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   i. පහත කවිය සම්පූර්ණ කරන්න.

      රන් බඳුනෙහි කෙසර
      තෙල් අඩු නොවී පවතින මෙන්

      ......................................................

      ......................................................

   ii. "ගිං ගඟ අයිනේ පිහිටි අපේ ගමේ බොහෝ දෙනා කරන්නේ ගඩොල් කැපීමේ වෘත්තියයි."
   මේ සඳහන ඇතුළත් කෘතියේ රචකයා කවුද?

   iii. "මේ පේරාදෙණිය ඉස්ටේසම"
   මෙය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

   iv. "මොනව ද වටේට දාන්නේ"?
   මෙය කාගේ ප්‍රකාශයක් ද?

   v. "එහෙත් ඔබටත් වරදින්නට බැරි නෑ"
   මෙය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

(ලකුණු 10)

5. පහත සඳහන් ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ලංකාවේ ඌව පළාතේ බදුල්ල නගරයට කි.මී. 5ක් පමණ දුරින් දුන්හිඳ දිය ඇල්ල පිහිටා ඇත. එහි උස 64m කි. බදුල්ල නගරය හරහා ගලා බසින බදුලු ඔය මෙම මනරම් දිය ඇල්ල නිර්මාණය කරයි. එය දිය ඇලි දෙකකින් සමන්විත ය. රමණීය කඳු පන්තිය මැදින් වැටුණු අඩිපාරක කි.මී. 2කට ආසන්න දුරක් පා ගමනින් දිය ඇල්ල නැරඹීමට යා යුතු ය. පා ගමන අවසානයේ හමු වන ආරක්ෂිත වේදිකාවේ සිට ප්‍රධාන දිය ඇල්ල නැරඹිය හැකි ය. පිවිසුම් දොරටුව පසු කර කිලෝ මීටර් භාගයකට අඩු දුරක දී අනෙක් දිය ඇල්ල මුණගැසේ. එය කුඩා දුන්හිඳ ලෙස හැඳින්වේ.

i. මෙහි සඳහන් වන ප්‍රධාන දිය ඇල්ල කුමක් ද?

ii. එය පිහිටා ඇත්තේ කුමන පළාතක ද?

iii. මේ දිය ඇල්ල නිර්මාණය කෙරෙනුයේ කුමකින් ද?

iv. ප්‍රධාන දිය ඇල්ල නැරඹිය හැක්කේ කොහි සිට ද?

v. පිවිසුම් දොරටුව පසුකර ගමන් කරද්දී හමු වන ඇල්ල හඳුන්වන නම කුමක් ද?

(ලකුණු 2 x 5 = ලකුණු 10)

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**තෙවන වාර පරීක්ෂණය - 2023**

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

**7 ශ්‍රේණිය**

**පිළිතුරු පත්‍රය**

## I කොටස

1. 3
2. 2
3. 2
4. 1
5. 2
6. 1
7. 4
8. 4
9. 2

10. කොළ මඩවන වේලාවයි
    කමත පිරෙන වේලාවයි
11. බිම
12. උත්තම
13. 3
14. න්‍යෂ්ටික පවුල : අම්මා , තාත්තා , දරුවෝ
15. නිජබිම
16. ශීඝ්‍රගාමී
17. ලොකු , පොඩි , ... සුදුසු නාම විශේෂණ සහ බියෙන් , වේගයෙන් , සෙමෙන් ... ආදි ලෙස සුදුසු ක්‍රියා විශේෂණ යොදා සම්පූර්ණ කිරීම ප්‍රමාණවත්.
18. සුදුසු නාම සහ ක්‍රියා විශේෂණ යොදා ඇත්නම් ලකුණු පිරිනමන්න.
19. නද , හඬ , රාවය , ...
20. සිඳු , සාගරය , සයුර ,....

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

**01)**

i. තොප්පි වෙළෙන්දා
ii. සෝමලතා සුබසිංහ
iii. නාට්‍යයට අදාළ සුදුසු චරිතයකට ලකුණු දෙන්න.
iv. සිසු අභිමතයට අනුව ලකුණු පිරිනමන්න.
v. සාමූහිකත්වය, පෞරුෂ ගුණාංග, රංගන කුසලතා ඔප් නැංවීම ...
   යනාදි සුදුසු පිළිතුරකට ලකුණු පිරිනමන්න.

( ලකුණු 2 × 5 = 10)

**02)** සුදුසු මාතෘකාවක් යටතේ සාරවත් ව කරුණු සංවිධානය කරමින් තර්කානුකූලව රචනාව ලියා දැක්විය යුතුය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය අක්ෂර වින්‍යාසය ගැනද සැළකිලිමත් වෙමින් රචනාව සංවිධානය විය යුතුය.

(ලකුණු = 20)

**03)** රාජකාරී ලිපියක ආකෘතිය
කරුණු සංවිධානය මත මනා ගැළපෙන අන්තර්ගතයක් තුළ රාජකාරී ලිපිය සකස් විය යුතුය.

(ලකුණු 10)

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**තෙවන වාර පරීක්ෂණය - 2023**

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

**7 ශ්‍රේණිය**

**පිළිතුරු පත්‍රය**

## I කොටස

1. 3
2. 2
3. 2
4. 1
5. 2
6. 1
7. 4
8. 4
9. 2

10. කොළ මඩවන වේලාවයි
 කමත පිරෙන වේලාවයි
11. බිම
12. උත්තම
13. 3
14. න්‍යෂ්ටික පවුල : අම්මා , තාත්තා , දරුවෝ
15. නිජබිම
16. ශීඝ්‍රගාමී
17. ලොකු , පොඩි , ... සුදුසු නාම විශේෂණ සහ බියෙන් , වේගයෙන් , සෙමෙන් ... ආදි ලෙස සුදුසු ක්‍රියා විශේෂණ යොදා සම්පූර්ණ කිරීම ප්‍රමාණවත්.
18. සුදුසු නාම සහ ක්‍රියා විශේෂණ යොදා ඇත්නම් ලකුණු පිරිනමන්න.
19. නද , හඬ , රාවය , ...
20. සිඳු , සාගරය , සයුර ,....

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

**01)**
 i. තොප්පි වෙළෙන්දා
 ii. සෝමලතා සුබසිංහ
 iii. නාට්‍යයට අදාළ සුදුසු චරිතයකට ලකුණු දෙන්න.
 iv. සිසු අභිමතයට අනුව ලකුණු පිරිනමන්න.
 v. සාමූහිකත්වය, පෞරුෂ ගුණාංග, රංගන කුසලතා ඔප් නැංවීම ...
 යනාදි සුදුසු පිළිතුරකට ලකුණු පිරිනමන්න.

( ලකුණු 2 × 5 = 10)

**02)** සුදුසු මාතෘකාවක් යටතේ සාරවත් ව කරුණු සංවිධානය කරමින් තර්කානුකූලව රචනාව ලියා දැක්විය යුතුය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය අක්ෂර වින්‍යාසය ගැනද සැළකිලිමත් වෙමින් රචනාව සංවිධානය විය යුතුය.

(ලකුණු = 20)

**03)** රාජකාරී ලිපියක ආකෘතිය
 කරුණු සංවිධානය මත මනා ගැළපෙන අන්තර්ගතයක් තුළ රාජකාරී ලිපිය සකස් විය යුතුය.

(ලකුණු 10)

**04)**

i. උතුමන් හද සපිරි
   කුලුණු මෙත් අඩු නොවී පවතියි.

ii. මහාචාර්ය තිස්ස කාරියවසම්

iii. නිවේදන

iv. අනුරාධ

v. ගොවි බිරියගේ නුවණ

(ලකුණු 2 × 5 = 10)

**05)**

i. දුන්හිඳ

ii. ඌව

iii. බදුලු ඔය

iv. පා ගමන අවසානයේ හමුවන ආරක්ෂිත වේදිකාවේ සිට

v. කුඩා දුන්හිඳ

(ලකුණු 2 × 5 = 10)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න